# GMOA

ESTABLISHED IN 1926
TU No. 291

THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION

No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk


23/8/2012

## මාධ්‍ය නිවේදනයයි.

**අදුරදර්ශී පරිපාලනය හේතුවෙන් කරවනැල්ල මූලික රෝහලේ රෝගී ජීවිත අවදානමේ.**

කරවනැල්ල මූලික රෝහලේ වෛද්‍ය අධිකාරීවරයා පසුගිය වසරක කාලයක් මුළුල්ලේ පෞද්ගලික හේතුවක් මත විදෙස්ගතව සිටි අතර එම කාලයේ වැඩ බලන වෛද්‍ය අධිකාරීතුමා විසින් රෝහලේ සියළුම කටයුතු ඉතා විධිමත්ව හා කාර්යක්ෂමව පවත්වාගෙන යනු ලැබීය. වෛද්‍ය අධිකාරීවරයා නැවත පැමිණීමත් සමඟ රෝහල තුල ඉතා අර්බුදකාරී තත්වයකට පත්විය.

ඔහු නැවත පැමිණීමත් සමඟ රෝහලේ සේවාවන් වල බොහෝ ගැටළු සහගත තත්වයකට පත්වී ඇති අතර රෝගී සත්කාරයට බලපාන ප්‍රායෝගික ගැටළු හඳුනා නොගැනිම, එම ගැටළු පෙන්වා දුන්නද විධිමත් ක්‍රියා මාර්ග නොගැනීම, දැනුම් දීමකින් තොරව පුහුණු වෛද්‍ය නිලධාරින් අත්තනෝමතික ලෙස වෙනත් ඒකක සඳහා අනුයුක්ත කිරිම, විශේෂඥ වෛද්‍යවරුන්ගේ උපදෙස් වලට පටහැනිව රෝගී සත්කාරයට බලපාන තීරණාත්මක තීන්දු ගැනීම මෙන්ම ඒ පිළිබඳ දැනුවත් කිරීමට ඉදිරිපත් වූ විට බැනවදිමින් කලහකාරී ලෙස හැසිරෙමින් වෛද්‍ය අධිකාරී වරයෙකුට නොගැලපෙන ලෙස ක්‍රියා කරමින් සිටී.

මෙම තත්වය පිළිබඳ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක ජනරාල් තුමා හා සෞඛ්‍ය ලේකම් තුමා වෙත සියළුම වෛද්‍ය නිලධාරින් ඒකමතිකව දන්වා යවා ඇති අතර මේ පිළිබඳ ඉක්මන් ක්‍රියාමාර්ගයක් ගැනීම මඟින් රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය වෘත්තිය සමිති ක්‍රියා මාර්ගයකට අවතීර්ණ වීම වලක්වා ගත හැකි බව දන්වා සිටිමු.

ස්තූතියි,

වෛද්‍ය චන්දික එපිටකඩුව
ලේකම්.

වැඩිදුර විස්තර :

වෛද්‍ය නලින් ආරියරත්න : 0714800942
වෛද්‍ය නලින්ද හේරත් : 0717876516
වෛද්‍ය නවීන් සොයිසා : 0718582444